## අලර්ක චිකිත්සාව හෙවත් පිස්සු බලු වෙදකම

පාරම්පරික වෛද්‍ය එල්.කේ. ශ්‍රියානි යමුණා මල්කාන්ති
පාරම්පරික වෛද්‍ය ඩබ්. තිලකපාල වැලිවත්ත

අලර්ක විෂය, ජලභීතය, ජලභීතිකා, උන්මත්ත ස්වාන විෂය, ජල ත්‍රාසය ආදී නම් කීපයකියන් හඳුන්වනු ලබන මෙම රෝගය ගැමි ජනයා විසින් හඳුන්වනු ලබන්නේ පිස්සු බලු විෂ නමිනි. බලු විෂ නමින් හැඳින්වුව ද මෙම රෝගය බල්ලන්ට පමණක් සීමාවූවක් නොවේ. නරි, මුගටි, දිවි, කොල දිවි, වලස්, බළල්, හරක්, මී, වඳුරු, රිලා, වවුලා, දඬුලේනා ආදී තෙලෙස් කුලයක සතුනට වැලඳෙන බව වෛද්‍ය පතපොතෙහි සඳහන් වේ. වැඩි වශයෙන් බල්ලන්ට වැලඳෙන නිසාත් බල්ලන්ට වැලඳෙන රෝගය ම මිනිසුන්ට විපත්ති කරන නිසාත් මෙය පිස්සු බලු රෝගය නමින් ව්‍යවහාරයට පත් වූ බව පෙනේ. රෝගය උත්සන්න වූ විට ජලයට දක්වන භීතිය නිසාත්, සිසිල් ජලයෙන් රෝග බීජ විනාශ වන නිසාත් "ජලභීතය" යන නම මෙයට අන්වර්ථ වශයෙන් යෙදී ඇත. ආයුර්වේදයට අනුව මෙම රෝගය ඇතිවන ආකාරය දක්වා ඇත්තේ මෙසේයඃ

ශාඩ්ගාලශ්වාන යොරුක්ෂ - ව්‍යාඝ්‍රාදීනං යදා නීලඃ
ශ්ලේෂ්ම ප්‍රදුෂ්ටො මුෂ්ණාති - සංඥං සංඥ මාර්ගාශ්‍රිතඃ

සිවල්, බලු, වලස්, ව්‍යාඝ්‍ර ආදීන්ගේ ශ්ලේෂ්මාවෙන් දූෂිත වූ වායුව යම් දිනයක මොළය සම්බන්ධ වූ සංඥා වහනය වන මාර්ගයන් ආක්‍රමණය කිරීමේ දී එදින උමතු රෝගයේ ආරම්භය සිදුවන බව දක්වා ඇත. වා පිත්, සෙම් යන තුන්දොස්වලින් එකක් හෝ වැඩි ගණනක් කිපීමෙන් සුනඛ ආදී සතුනට මෙම රෝගය වැලඳෙන නමුත් මනුෂ්‍යයාට එය වැලඳෙන්නේ රෝගය ඇති වූ සතෙකු විසින් සපා කෑමෙන්, පහුරු ගෑමෙන් බාහිර සම තුවාල වූ ස්ථානයක් ලෙව කෑමෙන් එම ශ්ලේෂ්ම කොටස් තැවරුණහොත් පමණි. සාමාන්‍ය බලු සපා කෑමක් වුව ද ඇතැම් විටක ආහාර විෂමතා හා ඍතු විපර්යාස නිසා උමතු අවස්ථාවට පෙරළීමට හැකියාව ඇති බව විශ්වාස කරනු ලැබේ.

**පිස්සු බල්ලා හඳුනා ගැනීම**

රෝගය වැලඳීමට පෙර ඇතිවන විශේෂ ලක්ෂණ

1. පිස්සුව වැලඳීමට ආසන්න වූ විට දීප්තිමත් හිරු එළිය හෝ පහන් එළිය නුරුස්සයි. අඳුරු අහුමුලු සොයමින් නින්දට යන නමුත් නිදාගත නොහැකි ව සිහිනෙන් බිය වී නැගිට දුවයි.
2. වෙනදා දක්වන කීකරු ගතිය වෙනස් වී උන්හිටි ගමන් සපා කෑමට තැත් කරයි.
3. රෞද්‍ර බල්ලෙක් නම් වෙනදා නොමැති කීකරු බවක් දක්වයි.
4. ඇස්වල වෙනදා නොමැති රත් පැහැයක් ඇති වේ.
5. රෞද්‍රත්වයක් මුසු වූ බැල්මකින් ස්වාමියා දෙස බලයි.
6. පුරුදු ආහාර අප්‍රිය කරයි. සමහරවිට ඒවා හොම්බෙන් ඈතට විසි කරයි.
7. පැදුරු, කොට්ට, මෙට්ට, ලී කැබලි, පොල්මුඩු, කඩදාසි ආදිය අසු වූ විට ඒවා තූ තූ කොට (තීරුවලට) ඉරා දමයි.
8. ඇස්වලින් කබ කඳුළු ගැලීමට පටන් ගනී.
9. උගුරේ කටුවක් හිරවුනා වැනි වේදනාවක් දක්වයි.
10. කටින් සෙම වැගිරී නැතහොත් සෙම කැටි කට වටේ රැඳී සිටී.
11. පිපාසය බලවත් වේ. එසේ වුව ද වතුර ගිලගත නොහැකි ව උගුරේ ගැස්මක් හට ගනී. එහෙයින් බොන වතුර ස්වාසනාලය දිගේ යාමෙන් තදබල පීඩාවක් ඇති වේ. අවසානයේ ජලය දැකීමට බිය වේ.
12. අමුතු හඬකින් උඩුබුරලීමට පටන් ගනී.

13. යටිහකු පාඩාව පණ නැති වේ, කොන්ද කැඩුන ස්වභාවයක් ගනී, වලිගය පහතට කඩා වැටේ, නිදා නැගිටින විට විසි වේ. ගොළුවෙයි. බිහිරි වෙයි.
14. හිස පසෙකට හරවා ඉදිරියට දුවයි.
15. රතුපාටට හා කළුපාටට විශේෂ බියක් දක්වයි.
16. වතුරට හා අවසානයේ ගින්දරට හා වාතයට බියවෙයි.
17. ඉදිරියට හමුවන සෑම සතෙක් ම, මනුස්සයෙක් ම සපා කෑමට පටන් ගනී.
18. අවසානයේ පස්ස ගාත් පන නැති වී පක්ෂාඝාත රෝගයට පෙරළී දින 10ක් ඇතුළත ඉතා දුක්ඛදායක ලෙස මරණයට පත් වේ.

**මිනිසාට රෝගය වැලඳීම**

සපාකනු ලැබුවේ පිස්සු බල්ලෙක් ම ද, එසේ නැතිනම් සාමාන්‍ය නීරෝගී බල්ලකු ද යන්න රෝගය පිළිබඳ උගත් වෛද්‍යවරයාට දැන ගත හැකිය. වර්තමානයෙහි නවීන තාක්ෂණයෙහි උපයෝගීත්වයෙන් බල්ලාගේ මොළය විද්‍යාත්මක පරීක්ෂණවලට යොමු කිරීමෙන් බල්ලා උමතු රෝගයෙන් පෙළුනේ ද නැද්ද යන වග නිශ්චය කළ හැක.

පිස්සුව වැලඳුනු බල්ලකු හෝ ඉහත නම් සඳහන් කර ඇති වෙනත් සතකු සපා කෑ පසු දින 3ක් ඇතුළත ප්‍රතිකාර පටන් නොගෙන රෝගයෙහි බරපතල තත්ත්වය ගණන් නොගෙන පැහැර හැරීම සිදු කළහොත් දින 45ක් වැනි සුළු කාලයකින් පසුව රෝගියාගේ ප්‍රතිශක්තිකරණය මත ඕනෑ ම වෙලාවක රෝගය වැලඳීමට ඉඩ ඇති බව දැනගත යුතුය.

රෝග විෂබීජය ශරීරගත වූ පසු වෙනත් රෝගවල දී මෙන් පූර්වයෙන් රෝග ලක්ෂණ පහළවීමක් සිදු නොවේ. රෝග ලක්ෂණ පෙන්නුම් කරනුයේ රෝගියා මරණයට පත්වීමට පැය 24කට පෙරය.

පිස්සු බල්ලකු සපා කෑ මිනිසකු ප්‍රතිකාර නොලබා දින 45ක් ගිය පසු සපා කෑ වියළි තුවාලය තිබෙන ස්ථානයේ සිට ඉහළට අධික වේදනාවක් සහිත උණක් හටගනී. දින 2,3 ක් මෙම තත්ත්වය පැවති පසු වතුර බිඳක් පවා ගිලගත නොහැකි ව උගුරේ ගැස්මක් හටගනී. එහෙයින් බොන වතුර, බෙහෙත් පවා ශ්වාසනාලය දිගේ යාමෙන් තද බල පීඩාවකට පත් වී අවසානයේ ජලය දැකීමට පවා බිය වී, සුළඟ දැනීම සහ එළිය දැකීමට පවා බිය වී රෝගය උත්සන්න වී පැය 24ක් ඇතුළත අවාසනාවන්ත හා දුක්ඛදායක ලෙස මරණයට පත් වේ.

**ශරීරයේ අශුභ ස්ථාන**

මර්මස්ථාන වශයෙන් සැලකෙන හෘදය, බෙල්ල, කම්මුල, හිස්කබල, කිහිලි, නිකට, උරහිස, පෙකනිය, රහසඟ අශුභ වන අතර ගෙලෙහි ඉහළ පෙදෙස සපා කෑමෙන් ඉක්මනින් රෝගය වැලඳීමට හේතුවන බව දැනගත යුතුය.

**ප්‍රතිකාර**

1. පිස්සු බල්ලකු හෝ සාමාන්‍ය බල්ලකු සපා කෑමෙන් පසු මුඛය වැසී තිබේ නම් පාදා ලේ මිරිකා හෝ ලේ ගැලීමට සලස්වන්න. කළුපාටට ලේ ගලා ඉවතට යාමට ඉඩ හරින්න.
2. ඉන්පසු සබන් ගා ගලාගෙන යන වතුර පහරකට තුවාලය අල්ලා සෝදා හරින්න. ඉන්පසු මෙම රෝගය පිළිබඳ දැන ඉගෙනගත් මනා උගත් වෛද්‍යවරයකු වෙත ප්‍රතිකාර සඳහා යොමු කරන්න.
3. පිස්සුබලු රෝගය සඳහා වැලිවත්ත වෙද පරපුරෙහි පාරම්පරික ප්‍රතිකාර විධි

**සැලකිය යුතු කරුණු**

- පළමු ව රෝගියෙක් පැමිණි පසු සපා කා ඇත්තේ කුමන සතෙක් ද
- සපා කෑ ස්ථානය මර්මස්ථාන ද, සාමාන්‍ය ස්ථානයක් ද යන බව
- තුවාලයේ ස්වභාවය
- සපා කෑ දින වකවානුව
- සපා කෑ සතා ජීවතුන් අතර සිටී ද, නැද්ද යන වග
- රෝගියාගේ ස්වභාවය
- ප්‍රතිකාර ලබා ගැනීම සඳහා රෝගියා සුදුසු වාතාවරණයක සිටී ද, නැද්ද යන වග
- වෛද්‍යවරයා විසින් රෝගයේ තත්ත්වය පිළිබඳව රෝගියා දැනුවත් කළ යුතුය.

4. පළමුව වැලිවත්ත වෙද පරපුරෙහි පවත්නා මන්ත්‍රයකින් 108 වරක් වතුර සමග දෙහි අත්තට මතුරා එම වතුරෙන් පළමු ව වෛද්‍යවරයාගේ මුඛය පිරිසිදු කොට එම වතුරෙන් ස්වල්පයක් රෝගියාට බීමට දී රෝගියාගේ තුවාලයේ ස්වභාවය බලා කටින් තුවාලයේ විෂ උරා දෙහි අත්තෙන් මතුරා විෂ හාහනය කරයි.
5. ඉන්පසු රෝගියාට නස්න කිරීමට අවශ්‍ය කෂාය, පාරම්පරික වට්ටෝරු අනුව සකස් කරන ලද රෝගයට අදාළ අරිෂ්ට වර්ග, තුවාලයේ විෂ ඇදීම සඳහා පත්තු, තුවාලය සේදීමට බෙහෙත් යනාදිය ලබා දී නැවත දින 3කින් රෝගියා ආපසු දෙවන බෙහෙත් පන්තිය සඳහා කැඳවයි.
6. එදින රෝගියාට දෙහි කැපීම, තෙල් මැතිරීම, නූල් දැමීම, තුවාලයට තෙල් ලබා දීම, කැඳ වර්ග, වේදනා නාශක බෙහෙත් වර්ග යන දෑ රෝග තත්ත්වය අනුව ලබා දෙනු ඇත.
7. නැවත තුන්වන බෙහෙත් පන්තිය සහ රෝගියාගේ ගුණ, අගුණ දැන ගැනීම සඳහා රෝගියා කැඳවනු ලැබේ.
8. සාමාන්‍ය බල්ලකු සපා කෑවා නම් මාස 2ක් ගත වූ පසු සහ පිස්සුව තිබෙන සතෙකු සපා කෑවා නම් මාස 3ක් ගත වූ පසු රෝගියා ගෙන්වා විෂ තිබේ ද, නැද්ද, යන්න දැන ගැනීම සඳහා අවසාන බෙහෙත් පන්තිය ලබා දී රෝගියා වෛද්‍යවරයාගෙන් නිදහස් කර ප්‍රතිකාරය අවසන් කරනු ලබයි.

වෙනත් රෝගාබාධවලට ප්‍රතිකාර ලබා ගන්නා ක්‍රමයට වඩා ජලභීතිකා රෝගයට ප්‍රතිකාර ලබා ගැනීමේ දී විශාල වෙනසක් ඇත. මන්ද අනෙකුත් රෝගාබාධවලට අතුරු ආබාධ ඇතිවෙන නමුදු ජලභීතිකා රෝගය වැලඳීගෙන එන රෝගියෙකුට එම කාලය තුළ අතුරු ආබාධ වැලඳීමක් නොමැත. අතුරු ආබාධ පහළ වනුයේ රෝගියා මරණයට පත්වීමට පැය 24කට කලින් වන නිසා රෝගියා සහ වෛද්‍යවරයා අතර සම්බන්ධතාවය සාමාන්‍ය බල්ලකු නම් මාස 2ක් හා පිස්සු බල්ලෙකු නම් මාස 3ක් පමණ තබා ගත යුතුය.